රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 267

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1984 සැප්තැම්බර් මස 21 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි.

<u>ජීවන වියදම් දීමනාව</u>

මාස හය කට පසුව සමාලෝචනය කිරීමට නියමිත වූ, 1984 මාර්තු 01 දින සිට මසකට රු: 102/=ක අතිරේක ජීවන වියදම් දීමනාවක් ගෙවීම අනුමත කරමින් නිකුත් කරන ලද 1984 අප්‍රේල් 05 දින හා අංක: 247 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සම්බන්ධයි.

02. සමාලෝචනයෙන් පසු 1984 අගෝස්තු මාසයේ ජීවන වියදම් දර්ශකය මත ගෙවිය යුතු <u>අතිරේක</u> මුදල මසකට රු: 56/= (පණස් හය) ක් වේ.

03. 1984 සැප්තැම්බර් 01 වෙනි දින සිට, මසකට රු: 102/= ගෙවීමට අතිරේකව මසකට ගෙවන මෙම රු: 56/=, 1934 අප්‍රේල් 05 වෙනි දින හා අංක: 247 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පදනම මත ගෙවිය යුතුය. දෛනික වැටුප් ලබන අය සම්බන්ධයෙන්, 1984 ජූනි 21 වෙනි දින හා අංක: 257 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ "අ" කොටසෙහි සඳහන් කොන්දේසි අදාළ වේ.

ආයතන අධ්‍යක්ෂ.